රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 47/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1989 සැප්තැම්බර් මස 27 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## පුස්තකාලයාධිපති සේවයේ වැටුප් හා බඳවාගැනීමේ පරිපාටි.

පුස්තකාලයාධිපති සේවයේ, පහත දැක්වෙන ශ්‍රේණිවල වැටුප් 1989.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කෙරේ.

| ශ්‍රේණිය | | වර්තමාන වැටුප (වාර්ෂික) | සංශෝධිත වැටුප (වාර්ෂික) |
|---|---|---|---|
| III ශ්‍රේණිය | රු. | 17280-14x480-6x600-27600 | රු. 23400-10x600-6x900-34800 |
| II ශ්‍රේණිය | රු. | 19680-9x480-8x600-28800 | රු. 25800-6x600-9x900-37500 |
| I ශ්‍රේණිය | රු. | 25200-13x600-33000 | රු. 27000-4x600-10x900-1x1200-39600 |
| අධි ශ්‍රේණිය | රු. | 40800-11x1200-54000 | වෙනසක් නැත. |

02. සංශෝධිත වැටුප් පරිමාණයන්ට වැටුප් පරිවර්තනය කළ යුත්තේ, ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන අනුවය.

03. 1971.02.25 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 30, 1971.11.08 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 74 හා 1982.01.21 දිනැති ආයතන චක්‍රලේඛ අංක 385 ට අවධානය යොමු කෙරේ. පුස්තකාලයාධිපති සේවයේ ඒ ඒ ශ්‍රේණියට බඳවා ගැනීමේ දී තිබිය යුතු වෘත්තීය හා වෙනත් සුදුසුකම් මෙසේය.

**III වන ශ්‍රේණිය:-**

1. කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා සහතිකය I වන කොටස හෝ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රථම පරීක්ෂණ සහතිකය හෝ ඒ හා සමාන සුදුසුකම්.

**II වන ශ්‍රේණිය:-**

1. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මධ්‍ය පරීක්ෂණය හෝ කනිෂ්ඨ විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යාව(පුස්තකාලයාධිපතිත්වය) පිළිබඳ ඩිප්ලෝමාව හෝ, කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යාව විෂය සහිත සාමාන්‍ය කලාවේදී උපාධිය හෝ කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා හා ප්‍රලේඛන සේවා වෘත්තීය උසස් සහතික පත්‍ර පරීක්ෂණයේ II වන පරීක්ෂණ සහතිකය සහ පිළිගත් පුස්තකාලයක පුස්තකාල කටයුතු පිළිබඳ වර්ෂ පහක පළපුරුද්දක් තිබීම.

- -

I වන ශ්‍රේණිය:- I. ඉහත II වන ශ්‍රේණිය යටතේ දැක්වූ සුදුසුකම් සමග පිළිගත් පුස්තකාල පුස්තකාල කටයුතු පිළිබඳ වර්ෂ දහයක පළපුරුද්ද

හෝ,

II. කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යාවේදී උපාධිය සහ උපාධිය ලැබීමෙන් පසු සහ පිළිගත් පුස්තකාලයක පුස්තකාල කටයුතු පිළිබඳ වර්ෂ පහක පළපුරුද්ද

හෝ,

III. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන පරීක්ෂණ සහතිකය සහ පිළිගත් පුස්තකාලයක පුස්තකාල කටයුතු පිළිබඳ වර්ෂ පහක පළපුරුද්ද

හෝ,

IV. කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා හා ප්‍රලේඛන සේවා වෘත්තීය උසස් සහතික පත්‍රය සහ පිළිගත් පුස්තකාලයක පුස්තකාල කටයුතු පිළිබඳ වර්ෂ පහක පළපුරුද්ද

අධි ශ්‍රේණිය:- I. ඉහත I වන ශ්‍රේණිය යටතේ දැක්වූ සුදුසුකම් සමග අවුරුදු 10 ක ප්‍රායෝගික පළපුරුද්ද

හෝ,

II. කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා විශේෂවේදී උපාධිය සහ උපාධිය ලැබීමෙන් පසු අවුරුදු පහක පුස්තකාල සේවයේ පළපුරුද්ද.

III. කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ අදාල සුදුසුකම් ලැබීමෙන් පසු අවුරුදු 2 ක ප්‍රායෝගික පළපුරුද්ද.

04. පුස්තකාලයාධිපති සේවයේ යම් ශ්‍රේණියකට පත්කිරීමට හෝ උසස්කිරීමට ඉහත 3 වන ඡේදයේ දැක්වෙන සුදුසුකම් තිබිය යුතු අතර, අදාල ආයතනය සතු පුස්තකාලයද එම ශ්‍රේණියේ පුස්තකාලයක් ලෙස ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩලය විසින් වර්ග කර තිබිය යුතුය. එමනිසා පුස්තකාලයාධිපති සේවයේ යම් ශ්‍රේණියකට පත්කිරීමට හෝ උසස්කිරීමට පෙර, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය අමතා අදාල පුස්තකාලය ශ්‍රේණිගත කරවා ගත යුතුය. (දැනටමත් එසේ කර නැතිනම්) තනතුරු අනුමත කරවාගැනීමට හා බඳවාගැනීමේ පරිපාටි අනුමත කර ගැනීමට ක්‍රියා කළයුත්තේ ඉන් අනතුරුවය.

05. දැනටමත් අනුමත කර ඇති බඳවාගැනීමේ පරිපාටි මේ අනුව සංශෝධනය කරවා ගත යුතුය.

06. පළාත් පාලන සේවයේ පුස්තකාලයාධිපතිවරුන් සම්බන්ධයෙන්ද මෙම විධිවිධාන අදාල වේ.

(පී.එච්.එම්.ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.